
KIDS GOD WORSHIP

www.kidworship.kr

# එස්තර් රැජින

– 27th Story–




195Page

පොතේ ගුරා　අලුත් රැජිනක් තෝරගන්නට රජු ගත් තීරණය හේතුවෙන් මුලු රටම ඉතා මහත් ප්‍රීතියෙන් සිටියා. තරුණියන් අලංකාර ඇඳුමින් සැරසී රාජ මාලිගාව අභියස සිටියා. මාලිගාවේ සිටි ඉශ්රායෙල් නිලධාරියෙක් වූ මොර්දෙකයිට නෑදෑ කෙනෙක් වූ එස්තර් නම් දියණියක් සිටියා. එස්තර් වනාහි ඉතාම ලස්සන කෙනෙකි. ඇයගේ දෙමව්පියන් මැරුණ-ායින් පසුව මොර්දෙකයි තමාගේම දුව මෙන් එස්තර්ව බලා ගත්තා.

මොර්දෙකයි　එස්තර්,... රජතුමා අලුත් රැජිනක් සොයනවා. අනික් සිය ගැහැනු ළමුන්ට වඩා, ඔයා ගොඩාක් ලස්සනයි. රජතුමා ඔයාවම තෝරන බවට කිසිම සැකයක් නෑ. නමුත් ඔයා කො-හෙන්ද එන්නේ කියන එක ඔයා කාටවත් කියන්න එපා. ඔයා ඉශ්රායෙල් වලින් එන බව කාටවත්ම කියන්න එපා. තේරුණා ද ?

.......................................................................................



196Page

දාසයා　රජතුමා ඉදිරියට එක් එක්කෙනා බැගින් පැමිණෙන්න.

පොතේ ගුරා　සියලු ගැහැණු ළමුන් ඉතාම ලස්සනට සැරසීගෙන රජු ඉදිරියට ආවා. ක්ෂණයකින්ම රජුගේ ඇස් නතර වුණා.

රජු　ආහ්... කෙතරම් ලස්සන තරුණියක් ද ?

ජනතාව　වාව්... එයා තමා අලුත් රැජිණිය.

පොතේ ගුරා　එස්තර්, රජුගේ ප්‍රසාදය දිනා ගත්තා. එවිට රජු රාජකීය ඔටුන්න ඇයගේ හිසේ පැළෙඳෙව්වා. එස්තර් දැන් නව රැජිණිය බවට පත් වුණා.

.......................................................................................



197Page

පොතේ ගුරා　එසේම හාමාන්වද නව අග්‍රමාත්‍යවරයා ලෙස පත් කරනු ලැබුවා.

රජු　හැම කෙනෙක්ම හාමාන් ඉදිරියේ වැටී ආචාර කරන්න.

ජනතාව　ආ... සැරදේවා හාමාන් අගමැතිතුමනි...

පොතේ ගුරා　ජනතාව සියලුදෙනාම තමන් ඉදිරියේ නැමී වඳිනු දුටු හාමාන් ඉතාම උද්ධාමයට පත් වුණා.

හාමාන්　(තමන් තුළම සිතයි) ආහ් මම ලොකු උතුම් කෙනෙක්. මට වඩා උත්තමයෙක් මේ රටේ තවත් නෑ.

පොතේ ගුරා　නමුත් එක් පුද්ගලයෙක් ඔහුට වැඳ වැටුණේ නැත. ඒ පුද්ගලයා එස්තර් කුඩා කාලයේ පටන් හදා වඩා ගත් තැනැත්තා වන මොර්දෙකයි වෙයි. මොර්දෙකයි වැඳ වැටුණේ දෙවියන්වහන්සේට පමණි. හාමාන් මේ ගැන දැඩි කෝපයට පත් වුණා.

හාමාන්　මොකක් ? ඔබ මා ඉදිරියේ වඳින්නේ නෑ ? මොර්දෙකයි උඹ බල්ලෙක්. මම උඹට දඬුවම් දෙන්නේ කොහොමද ? හා හා හහ්...

පොතේ ගුරා　මොර්දෙකයි වනාහි ඉශ්රායෙල් දේශයෙන් ආ මිනිසෙකු බව තේරුම් ගත් හාමාන් උපක්‍රමයක් සැළසුම් කළා.

හාමාන් රජතුමනි ! ඔබගේ රටේ නීති පිළිපදින්නේ නැති අමුතුම මිනිසුන් සිටිනවා නේද ?

රජු මොකක්ද? කවුද ඒ ජනතාව ?

හාමාන් ඒ වගේ මිනිසුන් ඔබගේ රාජ්‍යයට අපකීර්තියක් රජතුමනි.
එවැනි අය මරා දමන්න.

රජු හ්ම් ඉතා හොඳයි. ඔබ කියපු විදිහට කරන්න.

පොතේ ගුරා රජුගේ නමින් දැන්වීමක් සූදානම් කළ හාමාන් එය මුළු දේශයටම යැව්වා.

හාමාන් අපේ රටේ ජීවත්වෙන ඉශ්‍රායෙල් මරා දමා අපි ඔවුන්ගේ දේපළ ගත යුතුයි.

පොතේ ගුරා මෙය ඇසූ ඉශ්‍රායෙල්වරු කම්පනයකට පත් වී කෑම ගැනීම පවා අත්හැරියා. ඔවුන් ඇඳුම් ඉරාගෙන වැළපෙමින් සිටියා.
රාජ මාලිගයේ දොරකඩ හිඳගෙන මොර්දෙකයි ශබ්ද නගා හැඬුවා.

..........................................................................................


199Page

එස්තර් ඉශ්‍රායෙල්වරු වේදනාවෙන් වැළපෙමින් සිටින්නේ ඇයිද කියා, මොර්දෙකයිගෙන් ගිහින් අහන්න.

කාන්තාව ඔව්, මාගේ රැජිණියනි ! (ටික වෙලාවකට පසු) මාගේ රැජිණියනි... මාගේ රැජිණියනි... ඉතාම භයානක දෙයක් සිද්ධ වෙලා.

එස්තර් මොකක්ද ? ඒ ප්‍රශ්ණය ?

කාන්තාව ඉශ්‍රායෙල් ජනතාව මරනවලු. රජුට කතා කරලා ඉශ්‍රායෙල් සෙනඟ මුදවාගන්න කියා මොර්දෙකයි කිව්වා.

එස්තර් ආහ්..... මොකක් ද ?

පොතේ ගුරා එස්තර් රැජින කම්පනයට පත් වුණා. ඇය මේ රාජ නියෝගයට ඉතාම භය වුණා. තද වේදනාවකට පත් වූ ඇය, ඒ කාන්තාව නැවත මොර්-දෙකයි වෙතට පිටත් කළා.

..........................................................................................


200Page

මොර්දෙකයි මේ වගේ අමාරු කාලයන් එන නිසයි, කලින්ම ඇය රැජිනක් විදිහට පත්වුණේ කියා ඇයට කියන්න.

එස්තර් මා උදෙසා දින 3 ක් නිරහාරව යාච්ඤා කරන ලෙස ඉශ්‍රායෙල්වරුන්ට කියන්න. එයින් පසුව රාජ අණට එරෙහිව මම රජු ඉදිරියට යන්නෙමි.
මම නැතිවුණොත්, නැති වුණාවේ.

..........................................................................................


201Page

පොතේ ගුරා දින 3 කට පසුව, එස්තර් රැජින රජු ඉදිරියට ගියා. රජු ඇය ගැන පැහ-

රජු ඳීමකින් සිටියා.

එස්තර් ඔහ්.... එස්තර් එන්න. ඔයා මොනවද ඉල්ලන්නේ ? මේ දේශයෙන් දෙපං-


පොතේ ගුරා ගුවක් වුවත් මම ඔබට දෙනවා.

මාගේ රජතුමනි, මම ඔබ සහ හාමාන් වෙනුවෙන් භෝජන සංග්‍රහයක් පිළියෙල කරනවා.

රැජිණිගේ මේ ආරාධනාව ඇසූ හාමාන් තවත් කෝපයට පත් වුණා.
නමුත් රජතුමා මේ දෙයට ඉතාම කැමති වුණා. එස්තර් රජතුමාට පිළිතුරු දුන්නා.



202Page



203Page

| | |
|---|---|
| එස්තර් | මාගේ රජ්ජුරුවන්වහන්ස, කරුණාකර මාගේ ජනතාව මුදවාගන්න. |
| රජු | මොකක්ද ? ඔවුන් මරන්න යන්නේ කවුද ? |
| එස්තර් | ඒ තමයි හාමාන්. |
| හාමාන් | මොනවා ! ඒක බොරුවක්. රැජින මාව බේරගන්න. මගේ රජතුමනි !! |
| | ........................................................................................ |
| රජු | හාමාන් ඔබට වධ දෙනවද රැජිණි ය ?<br>ඔහු කෙතරම් අහංකාර මිනිහෙක් ද ? |
| පොතේ ගුරා | මේ සිදුවීම දැනගත් රජතුමා අන්තිමට මොර්දෙකයිව මරන්න සැළසුම් කළ එල්ලුම් ගහේම, හාමාන්ව තබා මරන්න අණ කළා.<br>එක් අවස්ථාවක දී රජුගේ ජීවිතය බේරාගැනීම උදෙසා මොර්දෙකයි ක්‍රියා කළ අන්දම රජතුමාට සිහිපත් වුණා.<br>ඒ නිසා මොර්දෙකයි තම අගමැතිවරයා වශයෙන් පත්කරනු ලැබුවා.<br>රැජින, රජුගෙන් තව ඉල්ලීමක් කළා. |
| එස්තර් | ඉශ්රායෙල් ජනතාව මරන්නේ නැති බවට නියෝගයක් ලියා යවන්න.<br>මාගේ රජ්ජුරුවන්වහන්ස.... |
| පොතේ ගුරා | එස්තර් රැජිනට අවශ්‍ය සෑම දෙයක්ම රජු විසින් කරන ලදී.<br>ඉශ්රායෙල්වරු මරණයෙන් ගැළවුණා. මේ ආකාරයෙන් රැජිනක් වූ එස්තර් යාච්ඤාවෙන් ඉශ්රායෙල් ජනතාව මුදවා ගත්තා. |
| | ........................................................................................ |
| ජීවිතයට අදාල කිරීම | ආදර පුතේ දුවේ ..... එස්ත්‍ර භය ගැහැණු ළමයෙක්. නමුත් ඇය යාච්ඤා කරලා පුදුම දේවල් කළා. යාච්ඤාව කියන්නේ මොකක්ද? දෙවියන්වහන්සේ සමග කතා කිරීමයි. ආහ්...<br>එහෙනම් ඔයාත් ඔයාට භය හිතෙන, දුක හිතෙන හැම දෙයක් ගැනම දෙවි පියාණන්වහන්සේ සමඟ කතා කරන්න.<br>හිතාගන්න බැරි පුදුම උත්තර ඔයාටත් ලැබේවි. |